**අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ ) උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2013**

**පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රය.**

**ව්‍යාපාර අධ්‍යයනය I** **කාලය-පැය 02**

***සකස් කිරීම :- අධ්‍යාපන අමාත්‍යංශයේ වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාවේ මෙහෙයවීමෙන්***

***උපදෙස්***

***සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.***

- ***අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි පිළිතුර තෝරා අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත්ඉර මත ලියන්න.***
- ***අංක 31 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත්ඉරි මත ලියන්න.***
- ***41 සිට 50 දක්වා ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.*** **(සියලුම හිමිකම් ඇවිරිනි)**

01. වුවමනාවල දැකිය හැකි ලක්ෂණ පමණක් අඩංගු පිළිතුර වන්නේ

1. පොදු වීම, සීමිත වීම සහ නිර්මාණය කළ හැකි වීම.
2. අසීමිත වීම, පොදු වීම සහ උප්පත්තිය සමඟ ඇති වීම.
3. ප්‍රාථමික වීම, පුද්ගලබද්ධ වීම සහ විවිධ වීම.
4. විවිධ වීම, අසීමිත වීම සහ නිර්මාණය කළ හැකි වීම.
5. සීමිත වීම, ද්විතීයික වීම සහ පුද්ගලබද්ධ වීම. (…….)

02. ව්‍යාපාර මූලික වශයෙන් බෙදී යන ආකාරය නිවැරදි ව දැක්වන්නේ පහත සඳහන් කුමන පිළිතුරෙහිද?

1. වෙළඳාම සහ උපකාරක සේවා
2. කර්මාන්ත සහ වාණිජ්‍යය
3. කර්මාන්ත සහ වෙළෙඳාම
4. වෙළඳාම සහ වාණිජ්‍යය
5. කර්මාන්ත සහ උපකාරක සේවා (…….)

03. පහත සඳහන් වන්නේ ව්‍යාපාරවලට බලපෑම් කරන පරිසර හා ඊට අයත් වන සාධක ය.

| | **ව්‍යාපාර පරිසර** | | **සාධක** |
|---|---|---|---|
| A | අභ්‍යන්තර | 1. | ආර්ථික, ගෝලීය, තාක්ෂණික |
| B | සාර්ව | 2. | අයිතිකරුවන්, සේවකයන්, කළමනාකරුවන් |
| C | ආසන්න | 3. | ගනුදෙනුකරුවන්, තරගකරුවන්, සැපයුම්කරුවන් |
| | | 4. | අයිතිකරුවන්, තරගකරුවන්, සංවිධාන සංස්කෘතිය |
| | | 5. | සංවිධාන සංස්කෘතිය, තාක්ෂණික, සංවිධාන ව්‍යුහය |

ඉහත ව්‍යාපාර පරිසර හා ඊට අදාළ සාධක ගැළපූ විට අදාළ නිවැරදි පිළිතුර වන්නේ

1. A-2, B-1, C-3
2. A-4, B-1, C-2
3. A-2, B-3, C-1
4. A-5, B-1, C-3
5. A-3, B-4, C-5 (…….)

04. සීමාසහිත ශ්‍රීධර සමාගම දුෂ්කර ප්‍රදේශයක පිහිටි රෝහලක රෝගීන් සඳහා ඇඳන් 25ක් පරිත්‍යාග කළ අතර තම ආයතනයේ සේවකයන් සඳහා වෛද්‍ය සායනයක් ද පැවැත්විය. සමාගම විසින් ඉටු කරන ලද්දේ,

1. සමාජයට හා පරිසරයට අදාළ සමාජ වගකීම් ය.
2. ආයෝජකයන්ට හා සේවකයන්ට අදාළ සමාජ වගකීම් ය.
3. ආයෝජකයන්ට හා පරිසරයට අදාළ සමාජ වගකීම් ය.
4. සමාජයට හා සේවකයන්ට අදාළ සමාජ වගකීම් ය.
5. පරිසරය හා සේවකයන්ට අදාළ සමාජ වගකීම් ය. (…….)

05. පහත වගුවේ x තීරුවෙහි ජාත්‍යන්තර ප්‍රමිති කිහිපයක් ද y තීරුවේ ඒවායෙන් ආවරණය වන ක්ෂේත්‍ර ද දැක්වේ.

| X | Y |
|---|---|
| A) ISO 9001 | 1. සංවිධානමය සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඳ කළමනාකරණ පද්ධති |
| B) ISO 14001 | 2. ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති |
| C) ISO 22000 | 3. ආයතනමය පරිසර කළමනාකරණ පද්ධති |
| D) OHSAS 18001 | 4. ආයතනමය තත්ත්ව කළමනාකරණ පද්ධති |

X හා y නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

1. A-1, B-2, C-3, D-4
2. A-3, B-4, C-2, D-1
3. A-2, B-3, C-4, D-1
4. A-4, B-3, C-1, D-2
5. A-4, B-3, C-2, D-1 (.......)

06. පහත සඳහන් කරුණු අතුරින් මූල්‍ය ප්‍රතිපත්තිය හා සම්බන්ධ වන්නේ කුමක්ද?
1. ආදායම් බදු ප්‍රතිශතය ඉහළ නැංවීම.
2. රාජ්‍ය වර්තන වියදම් අඩු කිරීම.
3. පොලී අනුපාතිකය ඉහළ නැංවීම.
4. වාර්ෂික අයවැය ලේඛනයෙහි හිඟය අඩු කිරීම.
5. රාජ්‍ය ප්‍රාග්ධන වියදම් ඉහළ නැංවීම. (.......)

07. පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධාන වර්ග 03ක් හා ඒවාට අදාළ ලක්ෂණ කිහිපයක් ඇතුළත් වගුවකි.

| ව්‍යාපාර සංවිධාන වර්ගය | වගකීම | පැවැත්ම | නීතිමය පුද්ගලභාවය |
|---|---|---|---|
| කේවල ව්‍යාපාර | A | අඛණ්ඩ නොවේ | D |
| සමූපකාර | සීමිත යි | C | ඇත |
| සීමාසහිත පොදු සමාගම් | B | අඛණ්ඩ යි | E |

ඉහත වගුවෙහි A, B, C, D සහ E යන හිස්තැන්වලට අදාළ ලක්ෂණ පිළිවෙලින් දැක්වෙන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

1. A- සීමිත B- අසීමිත C- අඛණ්ඩ යි D- නැත E- ඇත
2 A- අසීමිත B- සීමිත C- අඛණ්ඩ යි D- නැත E- ඇත
3. A- අසීමිත B- සීමිත C- අඛණ්ඩ නොවේ D- නැත E- ඇත
4. A- අසීමිත B- සීමිත C- අඛණ්ඩ යි D- ඇත E- ඇත
5. A- සීමිත B- අසීමිත C- අඛණ්ඩ නොවේ D- ඇත E- නැත (.......)

08. 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව ලියාපදිංචි කළ හැකි ප්‍රධාන සමාගම් වර්ග තුන අයත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

1) සීමාසහිත පොදු සමාගම්, සීමාසහිත පෞද්ගලික සමාගම්, ඇපයෙන් සීමිත සමාගම්
2) සීමාසහිත පෞද්ගලික සමාගම්, අක්වෙරළ සමාගම්, ඇපයෙන් සීමිත සමාගම්
3) සීමාසහිත සමාගම්, අක්වෙරළ සමාගම්, ඇපයෙන් සීමිත සමාගම්
4) ඇපයෙන් සීමිත සමාගම්, සීමාරහිත සමාගම්, විදේශීය සමාගම්
5) සීමාසහිත සමාගම්, සීමාරහිත සමාගම්, ඇපයෙන් සීමිත සමාගම් (.......)

09. පහත දැක්වෙන්නේ ව්‍යාපාරිකයන් පිළිබඳ තොරතුරු කිහිපයකි.

A) නිමල් කොටස් වෙළඳපොළෙහි කොටස් මිලදී ගැනීමේ හා විකිණීමේ යෙදී සිටියි.
B) නිමාලි පියාගෙන් උරුම වූ ව්‍යාපාරයට නවතම සේවා රුසක් එක් කරමින් පවත්වාගෙන යයි.
C) අමාලි දියවැඩියා රෝගීන්ට ගුණදායක යෝගට් වර්ගයක් නිපදවයි.
D) අමල් ක්‍රීඩා උපකරණ ආනයනය කර අලෙවි කරයි.
E) පියල් ඔහු විසින් ම සොයාගත් නව තාක්ෂණික ක්‍රියාවලියක් භාවිත කරමින් වාහන සේවා ආයතනයක් (Service Station) පවත්වාගෙන යයි.

ඉහත ව්‍යාපාරිකයන් අතුරෙන් ව්‍යවසායකයන් ලෙස සැලකිය හැකි පුද්ගලයන් ඇතුළත් කාණ්ඩය කුමක්ද?

1) B,C සහ E
2) A,B සහ C
3) B,D සහ E
4) C,D සහ E
5) A,C සහ E (.......)

10. පහත දෑ අතුරෙන් ආසන්න මුදල්වලට අයත් වන දෑ පමණක් ඇතුළත් තොරතුරු කාණ්ඩය තෝරන්න.

1) කාලීන තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා
2) කාලීන තැන්පතු, ඉතුරුම් තැන්පතු, ජංගම තැන්පතු
3) ජංගම තැන්පතු, වාණිජ පත්‍රිකා, ඉතුරුම් තැන්පතු
4) භාණ්ඩාගාර බිල්පත්, කාසි හා නෝට්ටු, වාණිජ පත්‍රිකා
5) කාසි හා නෝට්ටු, ජංගම තැන්පතු, ඉතුරුම් තැන්පතු (.......)

11. පහත දැක්වෙන්නේ මූල්‍ය ආයතන කිහිපයක් හා ඒවායෙන් ඉටු කරන කාර්යයන් කිහිපයකි.

| ආයතනය | කාර්යයන් |
|---|---|
| A ලියාපදිංචි මූල්‍ය සමාගම් | 1. ඉතිරිකිරීමේ තැන්පතු පවත්වාගෙන යාම, කාලීන තැන්පතු පවත්වාගෙන යාම, මැදි හා දිගුකාලීන ණය සැපයීම. |
| B බලපත්‍රලාභී වාණිජ බැංකු | 2. ආයෝජන හා කළමනාකරණ උපදෙස් සැපයීම, ව්‍යාපෘති වාර්තා සැකසීම, මූල්‍ය අලෙවි උපදේශන සේවා සැපයීම. |
| C වණික් බැංකු | 3. ඉල්ලුම් තැන්පතු පවත්වාගෙන යාම, විදේශ විනිමය කටයුතුවල යෙදීම, බැංකු අණකර පහසුකම් සැපයීම. |
| D බලපත්‍රලාභී විශේෂිත බැංකු | 4. කුලී පිට ණය මූල්‍යකරණය, කල්බදු මූල්‍යකරණය, ඉඩම් හා දේපළ වෙළඳාම් කටයුතු |

ඉහත ආයතන හා කාර්ය නිවැරදි ව ගළපන ලද පිළිතුර තෝරන්න.

1) A-2, B-4, C-3, D-1
2) A-3, B-1, C-4, D-2
3) A-1, B-2, C-3, D-4
4) A-4, B-3, C-2, D-1
5) A-4, B-1, C-3, D-2 (.......)

12. චෙක්පතක චුම්භක හැඳුනුම් තීරුවෙහි (MICR) දැක්වෙන අංක අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුරු කාණ්ඩය කුමක්ද?

1) ගිණුම් අංකය. චෙක්පත් අංකය. බැංකු අංකය. බැංකු ශාඛා අංකය
2) බැංකු අංකය. බැංකු ශාඛා අංකය. චෙක්පත් අංකය. ගිණුම් අංකය
3) චෙක්පත් අංකය. බැංකු අංකය. බැංකු ශාඛා අංකය. ගිණුම් අංකය
4) ගිණුම් අංකය. බැංකු අංකය. බැංකු ශාඛා අංකය. චෙක්පත් අංකය
5) චෙක්පත් අංකය. බැංකු ශාඛා අංකය. ගිණුම් අංකය. බැංකු අංකය (.......)

**13.** පහත දැක්වෙන්නේ ව්‍යාපාරිකයකුට මුහුණ පෑමට සිදු වන උවදුරු කිහිපයකි.

A) ආහාර පාන විෂ වීම නිසා පාරිභෝගිකයාට සිදු වන හානි
B) විදුලිය කාන්දු වීමෙන් ඇති වන හානි
C) මෝටර් රථ සඳහා සිදු වන හානි
D) ගොඩබිමෙන් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ දී සිදු වන හානි

ඉහත උවදුරු සඳහා ලබා ගත යුතු රක්ෂණ ඔප්පු පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක්ද?

1) මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය, ගිනි රක්ෂණය, තෙවන පක්ෂ රක්ෂණය, මහජන වගකීම් රක්ෂණය
2) මහජන වගකීම් රක්ෂණය, ගිනි රක්ෂණය, විස්තීරණ රක්ෂණය, මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය
3) ගිනි රක්ෂණය, විස්තීරණ රක්ෂණය, සොරබිය රක්ෂණය, මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය
4) මහජන වගකීම් රක්ෂණය, විස්තීරණ රක්ෂණය, සොරබිය රක්ෂණය, මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය
5) මහජන වගකීම් රක්ෂණය, ගිනි රක්ෂණය, මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය, සොරබිය රක්ෂ

(.......)

**14.** සන්නිවේදන මූලිකාංග කිහිපයක් X තීරුවේ ද එම මූලිකාංග පිළිබඳ ව පැහැදිලි කිරීම් Y තීරුවේ ද දැක්වේ.

| x | y |
|---|---|
| A ආකේතනය | 1. පණිවුඩය ලබන්නා දක්වන ප්‍රතික්‍රියාව |
| B විකේතනය | 2. පණිවුඩය මාධ්‍යයට ඇතුළු කිරීම |
| C ප්‍රතිචාරය | 3. පණිවුඩය ලබන්නාගෙන් යවන්නා වෙත ලැබෙන පිළිතුර |
| D ප්‍රතිපෝෂණය | 4. පණිවුඩය මාධ්‍ය හරහා ලැබීම |

ඉහත x හා y තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක්ද?

1) A-1, B-2, C-3, D-4
2) A-2, B-3, C-4, D-1
3) A-3, B-1, C-4, D-2
4) A-4, B-3, C-1, D-2
5) A-2, B-4, C-1, D-3 (.......)

**15.** A, B, C, D යන අක්ෂරවලින් අන්තර් ජාතික වෙළඳාමේ දී භාවිත වන ලියවිලි කිහිපයක් ද 1, 2, 3, 4 යන අංකවලින් ඒවායේ වැදගත්කමද දැක්වේ.

| ලියවිලි | වැදගත්කම |
|---|---|
| A හානි රක්ෂණ ලිපිය | 1. අපනයන භාණ්ඩවල වටිනාකම අපනයනකරුට ලැබීම තහවුරු වේ. |
| B සනීපාරක්ෂක සහතිකය | 2. වරණීය තීරු බදු ලබා ගැනීමට උපකාරී වේ. |
| C ප්‍රභවස්ථාන සහතිකය | 3. දූෂ්‍ය නෞභාරපතක් වෙනුවට පාරිශුද්ධ නෞභාරපතක් ලබා ගැනීමට ඉවහල් වේ. |
| D ණයවර ලිපිය | 4. ඇතැම් කෘෂි නිෂ්පාදනවල පාරිභෝජන යෝග්‍යතාව සහතික කරයි. |


ඉහත තීරු දෙක නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

1) A-3, B-4, C-2, D-1
2) A-2, B-3, C-1, D-4
3) A-3, B-4, C-1, D-2
4) A-3, B-1, C-2, D-4
5) A-1, B-2, C-3, D-4 (.......)

16. "කළමනාකරණය" නිවැරදිව අර්ථ දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

1) ආයතනයක් විසින් ළගා කර ගැනීමට අපේක්ෂිත අරමුණු හා පරමාර්ථ ස්ථාපිත කර ගැනීමේත් ඒවා ඉටු කර ගැනීම සඳහා උපාය මාර්ග ස්ථාපිත කිරීමේත් ක්‍රියාවලිය යි.
2) සංවිධානයක අරමුණු හා පරමාර්ථ කාර්යක්ෂම හා සඵලදායී ආකාරයෙන් ඉටුකර ගැනීම පිණිස සම්පත්, බලතල හා වැඩ බෙදාහැරීම සම්බන්ධ ක්‍රියාවලිය යි.
3) සංවිධානයක අරමුණු හා පරමාර්ථ සඵලදායී ව ඉටු කර ගැනීම සඳහා සංවිධානයේ සම්පත් කාර්යක්ෂම ව යෙදවීමේ ක්‍රියාවලිය යි.
4) ආයතනයේ අරමුණු හා පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතුවල පුද්ගලයන් නිරත කරවීම කෙරෙහි බලපෑම් කිරීමේ හා අභිප්‍රේරණය කිරීමේ ක්‍රියාවලිය යි.
5) ආයතනයක අරමුණු හා පරමාර්ථ ඉටුවන ආකාරයෙන් සැලසුම් නිසිපරිදි ක්‍රියාත්මක වේ ද යන්න පරීක්ෂා කිරීමේත් වෙනස් වීම් ඇත්නම් ඒවා නිවැරදි කිරීමේත් ක්‍රියාවලිය යි. (…….)

17. ව්‍යාපාර ආයතනයක සංවිධාන සටහනෙන් උපුටා ගත් කොටසක් පහත දැක්වේ.




මෙම ආයතනය දෙපාර්තමේන්තුකරණය වී ඇති පදනම වන්නේ
1) ගනුදෙනුකරු පදනම යි.
2) භූගෝලීය පදනම යි.
3) නිෂ්පාදිත පදනම යි.
4) ශ්‍රිතමය පදනම යි.
5) මිශ්‍ර පදනම යි. (…….)

18. පහත දැක්වෙන්නේ කළමනාකරණ මූලිකාංගවලට අයත් කාර්ය කිහිපයකි.


A) වැඩ බෙදීම
B) සන්නිවේදනය
C) ප්‍රමිති ස්ථාපිත කිරීම
D) අභිප්‍රේරණය
E) සමායෝජනය
F) දෙපාර්තමේන්තුකරණය
G) නායකත්වය
H) විකල්ප ඇගයීම

ඉහත කාර්යයන් අතුරෙන් මෙහෙය වීමට අයත් කාර්ය වන්නේ
1) A,B සහ D ය.
2) B,D සහ G ය.
3) B,C සහ H ය.
4) C,D සහ F ය.
5) E,F සහ G ය. (…….)

19. නිෂ්පාදන ආයතනයක මුළු ස්ථාවර පිරිවැය රු.මිලියන 02ක් ද විකුණුම් ආදායම රු.මිලියන 10ක් ද විකුණුම් ඒකක සංඛ්‍යාව 1000ක් ද මුළු ශ්‍රම පිරිවැය මිලියන 03ක් හා මුළු සෘජු ද්‍රව්‍ය පිරිවැය මිලියන 02ක් ද වේ නම් සමච්ඡේදන ලක්ෂ්‍යයට අදාළ ඒකක ප්‍රමාණය වනුයේ

1) ඒකක 400කි.
2) ඒකක 2000කි.
3) ඒකක 4000කි.
4) ඒකක 20,000කි.
5) ඒකක 40,000කි. (.......)

20. පහත දැක්වෙන්නේ තොග මට්ටම් නිරූපණය කෙරෙන ප්‍රස්ථාරයකි.




ඉහත ප්‍රස්ථාරයේ A, B, C, D හා E අක්ෂරවලින් පිළිවෙලින් පෙන්නුම් කරනුයේ

1) යළි ඇණවුම් ප්‍රමාණය, අවම තොග මට්ටම, උපරිම තොග මට්ටම, ආරක්ෂිත තොගය හා යළි ඇණවුම් මට්ටම යි.
2) ආරක්ෂිත තොගය, අවම තොග මට්ටම, යළි ඇණවුම් මට්ටම, යළි ඇණවුම් ප්‍රමාණය හා උපරිම තොග මට්ටම යි.
3) අවම තොග මට්ටම, යළි ඇණවුම් මට්ටම, ආරක්ෂිත තොගය, යළි ඇණවුම් ප්‍රමාණය හා උපරිම තොග මට්ටම යි.
4) අවම තොග මට්ටම, යළි ඇණවුම් මට්ටම, යළි ඇණවුම් ප්‍රමාණය, ආරක්ෂිත තොගය හා උපරිම තොග මට්ටම යි.
5) ආරක්ෂිත තොගය, යළි ඇණවුම් ප්‍රමාණය, අවම තොග මට්ටම, යළි ඇණවුම් මට්ටම හා උපරිම තොග මට්ටම යි. (.......)

21. පහත දැක්වෙන්නේ නිෂ්පාදිතයක් විවිධ වටිනාකම් එකතු වන සේ වෙළෙඳපොළට ඉදිරිපත් කරන මට්ටම් කිහිපයකි.

A) වැඩි දියුණු කළ නිෂ්පාදිතය
B) මූලික නිෂ්පාදිතය
C) අපේක්ෂිත නිෂ්පාදිතය
D) හර ප්‍රතිලාභ
E) විභව නිෂ්පාදිතය

ඉහත මට්ටම් අනුපිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. B, C, A, D හා E
2. D, B, A, E හා C
3. B, D, C, A හා E
4. D, B, E, A හා C
5. D, B, C, A හා E (.......)

22. ව්‍යාපාර ආයතන තමන්ට පක්ෂපාති ගනුදෙනුකරුවන් දිනා ගැනීම සඳහා අනුගමනය කරන මිල ක්‍රමය වනුයේ

1. වට්නාකම් මිලකරණය යි.
2. සංජානනීය වට්නාකම් මිලකරණය යි.
3. ඉලක්ක ඉපයීම් මත මිලකරණය යි.
4. ලකුණු කළ මිල ක්‍රමය යි.
5. පවත්නා මිල අනුව මිල නියම කිරීමේ ක්‍රමය යි. (.......)

23. යතුරු පැදි ආනයනය කර බෙදා හැරීමේ නියුක්ත ආයතනයක් ඉදිරිපිට පහත දැක්වෙන ප්‍රකාශය ප්‍රදර්ශනය විය.

"සෑම යතුරු පැදියක් සමඟ ම අගනා හිස් වැස්මක් (Helmet) නොමිලේ"

ඉහත ප්‍රකාශය තුළින් සිදුකෙරෙනුයේ

1. පෞද්ගලික අලෙවිය යි
2. වෙළෙඳ ප්‍රවර්ධනය යි
3. ඍජු අලෙවිකරණය යි
4. පාරිභෝගික ප්‍රවර්ධනය යි
5. විකුණුම් සේවක ප්‍රවර්ධනය යි (.......)

24. පහත දැක්වෙන්නේ අරමුදල් සම්පාදන මාර්ග කිහිපයකි.

A) රඳවාගත් ලාභ
B) කොටස් නිකුතුව
C) වාණිජ පත්‍රිකා
D) බැංකු අයිරා

විවිධ නිර්ණායක යටතේ ඉහත දෑ වර්ග කළ විට පහත සඳහන් කුමන පිළිතුර නිවැරදි වේද?

1. A හා D අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ග වන අතර B හා C බාහිර මූල්‍ය සම්පාදන මාර්ග වේ.
2. A හා B ඍජු මූල්‍ය සම්පාදන මාර්ග වන අතර C හා D කෙටි කාලීන මූල්‍ය සම්පාදන මාර්ග වේ.
3. A හා C ඍජු මූල්‍ය සම්පාදන මාර්ග වන අතර B හා D බාහිර මූල්‍ය සම්පාදන මාර්ග වේ.
4. A හා D අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ග වන අතර B හා C වක්‍ර මූල්‍ය සම්පාදන මාර්ග වේ.
5. A හා B වක්‍ර මූල්‍ය සම්පාදන මාර්ග වන අතර C හා D ඍජු මූල්‍ය සම්පාදන මාර්ග වේ.

(.......)

25. පහත දැක්වෙන්නේ මූල්‍ය අනුපාත කිහිපයකි.

A) ජංගම අනුපාතය
B) පොලී ආවරණ අනුපාතය
C) ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය
D) තොග පිරිවැටුම් අනුපාතය
E) හිමිකම් ප්‍රාග්ධන මත ප්‍රතිලාභ අනුපාතය
F) ණයගැති පිරිවැටුම් අනුපාතය
G) ණය හිමිකාරත්ව අනුපාතය
H) මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය

ඉහත අනුපාත අතුරෙන් ක්‍රියාකාරී අනුපාත යටතට ගැනෙන්නේ

1. A, B හා C ය.
2. D, C හා E ය.
3. A, C හා H ය.
4. B, E හා F ය.
5. D, F හා H ය. (.......)

26. රජයට අවශ්‍ය කෙටි කාලීන අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා නිකුත් කරන තිර්ලේඛන සුරැකුම් පතකි.

1. රුපියල් ණය සුරැකුම්පත්.
2. තැන්පතු සහතික.
3. භාණ්ඩාගාර බිල්පත්.
4. වාණිජ පත්‍රිකා.
5. භාණ්ඩාගාර බැඳුම්කර. (.......)

27. යම් නිශ්චිත අරමුණක් ඉටු කිරීම පිණිස ආයතනයේ වැඩ ඒකකයක් වශයෙන් කළ යුතු කාර්යයන්, යුතුකම් සහ වගකීම් සකස් කිරීම හැඳින්වෙන්නේ

1. රැකියා නිර්මාණය ලෙසය.
2. රැකියා විග්‍රහය ලෙසය.
3. රැකියා විශ්ලේෂණය ලෙසය.
4. රැකියා පිරිවිතරය ලෙසය.
5. රැකියා ඇගයීම ලෙසය. (.......)

28. සේවකයින් අභිප්‍රේරණය සඳහා දෙනු ලබන මූල්‍ය නොවන ප්‍රතිලාභ ඇතුළත් පිළිතුරු කාණ්ඩය කුමක් ද?

1. අඩු පොලියට ණය සැපයීම, නොමිලේ නිවාස සැපයීම, අසනීප නිවාඩු ලබා දීම.
2. ප්‍රසාද දීමනා, අතිකාල ගෙවීම්, නොමිලේ ගමන් පහසුකම්
3. විවේකාගාර පහසුකම්, වෛද්‍ය පහසුකම්, අතිකාල ගෙවීම්
4. ආහාර පාන, වෛද්‍ය පහසුකම්, ගමන් පහසුකම්
5. භාණ්ඩ හා සේවා අඩු මිලට සැපයීම, විශ්‍රාම වැටුප්, අර්ථසාධක හිමිකම් (.......)

29. පහත වගුවේ x තීරුවේ භාවිත කරන මට්ටම අනුව තොරතුරු පද්ධති දැක්වෙන අතර y තීරුවේ තොරතුරු පද්ධති පරිශීලනය කරන පුද්ගලයින් දැක්වේ.

| X | Y |
|---|---|
| A උපක්‍රමික මට්ටම | 1. ගිණුම් ලිපිකරු |
| B කළමනාකරණ මට්ටම | 2. ප්‍රධාන විධායක නිලධාරී |
| C දැනුම මට්ටම | 3. සුපරීක්ෂකයින් |
| D මෙහෙයුම් මට්ටම | 4. මධ්‍ය කළමනාකරුවන් |

X තීරුව හා Y තීරුව නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ

1. A-2, B-4, C-1, D-3
2. A-2, B-3, C-1, D-4
3. A-4, B-2, C-1, D-3
4. A-2, B-4, C-3, D-1
5. A-3, B-4, C-1, D-2 (.......)

30. පහත වගුවේ X තීරුවේ ව්‍යාපාර සැලැස්මක අංග දැක්වෙන අතර Y තීරුවේ ඒවායෙහි වැදගත්කම දැක්වේ.

| X | Y |
|---|---|
| A විධායක සාරාංශය | 1. තම නිෂ්පාදිතය සඳහා වර්ධනය වන වෙළඳපොළක් ඇතිවන බව පෙන්වා දෙයි. |
| B අලෙවි සැලැස්ම | 2. නිෂ්පාදන ක්‍රියාවලිය හා සම්බන්ධ කටයුතු පිළිබඳව අවබෝධය ලබා දෙයි. |
| C මෙහෙයුම් සැලැස්ම | 3. ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් ප්‍රවාහ නිගමනයට සහ අරමුදල් සම්පාදනය පිළිබඳ තොරතුරු ලබා දෙයි. |
| D මූල්‍ය සැලැස්ම | 4. ආයතනයක සේවක අවශ්‍යතා දැනගෙන ඊට සූදානම් වීමට මඟපෙන්වයි. |
| E මානව සම්පත් සැලැස්ම | 5. ව්‍යාපාර සැලැස්ම පිළිබඳව මගපෙන්වීමක් ඇති කරයි. |

X තීරුව හා Y තීරුව නිවැරදි ව ගැලපූ විට ලැබෙන පිළිතුර කුමක්ද?

1. A-5, B-1, C-3, D-2, E-4
2. A-5, B-1, C-2, D-3, E-4
3. A-2, B-1, C-3, D-4, E-5
4. A-3, B-2, C-1, D-5, E-4
5. A-5, B-3, C-4, D-1, E-2 (…….)

**31 සිට 40 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

31. ලාභ ලබා ගැනීමට අමතර ව ව්‍යාපාරයක් විසින් මුළුමහත් සමාජයට ම සාධාරණයක් වන පරිදි කටයුතු කිරීම ……………………… ලෙස හැඳින්වෙන අතර තමන් සමඟ කටයුතු කරන සියලු ම පාර්ශවයන්ට යහපතක් සිදුවන ආකාරයට කටයුතු කිරීම ……………………… ලෙස හැඳින්වේ.

32. රාජ්‍ය ආදායම ……………………… හා ……………………… ලෙස වර්ග කළ හැකි අතර, රාජ්‍ය වියදම ……………………… හා ……………………… ලෙස වර්ග කළ හැකි ය.

33. (අ) 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ප්‍රධානතම ලියවිල්ල ……………………… වේ.

(ආ) 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව සමාගමක් ලෙස ලියාපදිංචි කළ බවට සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලියවිල්ල ……………………… වේ.

34. (අ) ව්‍යවසායකයෙකුගේ මූලික කාර්ය වන්නේ ……………………… යි.

(ආ) කර්මාන්තය තුළ ආධිපත්‍ය පැතිර විය නොහැකි ව්‍යාපාර ……………………… ලෙස හැඳින්වේ.

35. බැංකු අයිරා ……………………… හා ……………………… යනුවෙන් වර්ග දෙකකි.

36. උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුමට ……………………… , ………………… හා ……………………… යන රටවල් අයත් වේ.

37. (අ) සේවකයකු එක් ප්‍රධානියෙකුට පමණක් වගකිව යුතු යි යන මූලධර්මය …………………… ලෙස හැඳින්වේ.

(ආ) එක් ප්‍රධානියෙකු යටතේ සිටින යටත් නිලධාරීන් සංඛ්‍යාව ……………………… ලෙස හැඳින්වේ.

38. තනතුරට බඳවා ගත් නව සේවකයකු තනතුරෙහි ස්ථිර කිරීමට පෙර සේවය කළ යුතු කාලය ………………………. වන අතර ශිල්පීය වෘත්තියක් සඳහා බඳවා ගත් සේවකයෙකු පුහුණුව සඳහා ගත කළ යුතු කාලය ………………………. වේ.

39. I) වෙබ් අඩවි තුළට මෙන් ම දත්ත සමුදායක් තුළ ඇති තොරතුරුවලට ප්‍රවේශ වන උපකරණය ……………………. යන නමින් හැඳින්වේ.

II) තීරණ ගැනීම, නියාමනය හා පාලනය සඳහා සහාය වන තොරතුරු පද්ධතිය වන්නේ ………………………. යි.

40. මූල්‍ය සැලැස්මේ දැක්වෙන ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය ………………………., ………………………. හා ………………………. යන කොටස්වලින් සමන්විත වේ.

**41-50 දක්වා ප්‍රශ්න වලට කෙටි නිශ්චිත පිළිතුරු ලියන්න.**

41. ව්‍යාපාර ක්‍රියාවලියට අයත් කාර්ය හතරක් නම් කරන්න.
1. ……………………….
2. ……………………….
3. ……………………….
4. ……………………….

42. ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය කිරීමෙන් ව්‍යාපාරිකයකුට හඳුනාගත හැකි වන්නේ
1. ……………………….
2. ……………………….
3. ……………………….
4. ……………………….

43. අන්තර් ජාතික පාරිභෝගික සමිති සම්මේලනය විසින් ප්‍රකාශයට පත් කර ඇති පාරිභෝගික අයිතිවාසිකම් **හතර** නම් කරන්න.
1. ……………………….
2. ……………………….
3. ……………………….
4. ……………………….

44. වරළත් ව්‍යාපාර වර්ග **03** නම් කරන්න.
1. ……………………….
2. ……………………….
3. ……………………….

45. ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර **හතර** නම් කරන්න.
1. ……………………….
2. ……………………….
3. ……………………….
4. ……………………….

46. හොඳ ප්‍රවාහන ක්‍රමයක ගුණාංග **හතරක්** දක්වන්න.
1. ……………………….
2. ……………………….
3. ……………………….
4. ……………………….

47. මෙහෙයුම් පිරියත සැලසුම් වර්ග හතරක් නම් කරන්න.
1. ……………………….
2. ……………………….
3. ……………………….
4. ……………………….

48. සඵලදායී වෙළඳපොළ බණ්ඩනයක් සඳහා පැවතිය යුතු අවශ්‍යතා හතරක් නම් කරන්න.
1. ……………………….
2. ……………………….
3. ……………………….
4. ……………………….

49. මුදල් වෙළෙඳපොළට අයත් උප වෙළෙඳපොළවල් **හතරක්** නම් කරන්න.

1. ..............................
2. ..............................
3. ..............................
4. ..............................

50. (අ) මාධ්‍ය දෙකක් හෝ වැඩි ගණනක් පරිගණක භාවිතයෙන් ඒකාබද්ධ කිරීමේ පහසුකම හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

1. ..............................

(ආ) ආයතනයක් තුළ තොරතුරු සන්නිවේදනය සඳහා සකස් කරනු ලබන පරිගණක ජාලය කුමන නමකින් හැඳින්වේ ද?

1. ..............................

***